# හිම කුමාරි



අකීෂා යෙනුලි කරුණාරත්න

# හිම කුමාරි

කර්තෘ : අකීෂා යෙනුලි කරුණාරත්න

ISBN 978-624-206-866-4

පළමු පිටපත සහ මුද්‍රණ
30/11/2023

කතාව සහ චිත්‍ර: අකීෂා යෙනුලි කරුණාරත්න

4 වසර B

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ස්තුතිය

මෙම පොත ලිවිමට

මට උදව් කල

මාගේ ගුරුතුමිය වන

සමන්මලී ගුරුතුමියටත්,

අනෙකුත්

හැම දෙනාටමත්

ස්තුතියි.

**අකීෂා**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගිම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකිම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලිය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්විම අපගේ වගකිමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණ කරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණකත් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩකැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “ **දිවිය දිනන විද්‍යුත් පොතක්** ” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගතුවරයෙකුවිම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “ **දිවිය දිනන විද්‍යුත් පොතක්** ” ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 10 . 20

## <u>පිදුම</u>

මගේ

ආදර

ගුරු තුමිය,

සමන්මලී ගුරුමැණියනි

ඔබ

නමින්

පුදමි

මෙම පොත

එකොමත් එක කාලේක හිටියා ලස්සන දිය කිඳුරියක්. එයාගේ නම හිම කුමාරි කිවුවොත් හැමෝම දන්නවා. එයා ජීවත් වුණේ ලස්සන ම ලස්සන මුහුදු පතුල යට. එයාට ගොඩාක් යාළුවෝ හිටියා. පාට පාට මාළු, කැස්බෑවෝ, දිය කිඳුරියෝ එක්ක සතුටින් කාලය ගත වුණා.



දවසක් දා හිම කුමාරිට මුහුදෙන් එළියට එන්න ආස හිතුණා. ඉතින් මුහුදේ ගැඹුරේ ඉඳලා හිම කුමාරි එළියට ආවා.



ඉතින් එයාට හරිම සතුටුයි. මුහුදු පතුලේ ඉඳලා වෙරළ දැක්ක නිසා එළියේ විවිධ මිනිසුන්, ගෙවල්, ඔරු, කඩවල්, වාහන, ගොඩනැගිලි දැක්කා. හිම කුමරියට ආස හිතුණා ඒ නගරේ අසිරිය බලන්න.




ඉතින් එයා කල්පනා කලා මට යන්න බැහැනේ, මට ඇවිදින්නත් බැහැනේ, මට වරල් දෙකක්නේ තියෙන්නේ කියලා. ඉතින් හිම කුමරියට දුක හිතුන නිසා එයා කල්පනා කළා.



ඉතින් මේ හිම කුමරිය ගලක් උඩට වෙලා කල්පනා කර කර ඉන්න කොට වෙරළට ආපු අම්මා කෙනෙකුයි, දෝණියෙකුයි හිම කුමරියව දැක්කා. මේ දෙන්නා හිමීට හිමීට කුමරිය ළඟට ගියා .එයා හරිම ලස්සන දිය කිඳුරියක්.




අම්මාට හිමකුමාරි ගැන දුක හිතිලා එයා ළඟට ගිහින් හිම කුමාරිට ගෙදර යන්න කතා කළා. හිම කුමාරි හරිම ආසාවෙන් ඒ දෙන්නා සමග ගෙදර ගියා. හිම කුමාරිට අලුත් ගෙදරක්, පවුලක් හම්බ වුණා.



එයාට අලුත් ගවුම්, කෑම බීම ලැබුණා. එයාට අළුත් නමකුත් ලැබුණා. ඒ තමයි මිලී. මිලීට අම්මයි තාත්තයි නංගියි තම දුවෙකුට මෙන් සැලකුවා. මිලී අලුත් ජීවිතයකට පුරුදු වුණා.



මිලී නංගිට පාසල් වැඩ වලට උදව් කලා. හැම සති අන්තෙම මිලී පවුලේ අය සමග මුහුදු වෙරළට ගියා. එහිදී මිලී තමන්ගේ නංගිට පිහිනීමට පුරුදු කළා.



එයාගේ පරණ මිතුරියන් බැලිමට ඇය මුහුදු පතුලට ගියා. ඇය විනෝදයෙන් ජීවත් වුණා.

එයා තව තවත් ලොකු වුණා. හිම කුමරිය දැන් එයාගේ පවුලේ සිටින ලොකුම දැරිය බවට පත් වුණා.





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකය යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනිම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියනa සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු !

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 . 10 . 20